

# අසෙනිය කුසුම

නිරාෂ ගුණසේකර



**'අසෙනිය කුසුම' තීරුව දිග හැරෙන්නේ අපේ හිත ගත් කවියක විඳුම් විඳවුම් කෙබඳුද යන්න සහෘද ඔබත් සමඟ බෙදා හදා ගන්නටය. මෙය තවත් එක කාව්‍ය විචාරයක් නොවන අතර තොරාගනු ලබන කවියක් හොඳද නරකදැයි නිගමන නොදී, මිණුම් දඬු හා විචාරක්ෂීන් ගලවා තබා කවිය තුළම ගිලී කිමිදී රස උල්පත් පාදා ගන්නයි මේ කුඩා වෑයම.**

## රාජාලි පියාපත

යොමා තියුණු ඇස්
ලොවම දකිනු වස්
බලා සිටී යෝධ රාජාලියා
නුදුටුවේ මන්ද මා
උහු පා ළඟම පිටුපසින් සිටිනා...

තියුණු නිය පහුරු මැද
රැඳුණි අමු මස් සහ රුහිරු
ඉසිලිය නොහැකි සේ දැන්
දැනෙයි පිළී ගඳ අඩු නැති
වා තලය හා මුසු වන...

කාන්තාරයේ වැලි බිම
කටු පඳුරු මැද තිබූ එකම මල
දවයි දහවල සැඩ හිරු
ගිනි සුළඟ හති දමන
උරා අවසන් තෙතමනයද
අනුකම්පාවක් නැතියෙන...

රාජාලි පියාපත් යට
සෙවණ සුවදායකය ගතට
වැතිර ගම් ඇස් පියා
පිටනොකර තද හුස්මකුදු
බිඳේ යයි උහු දැහැන සැකයෙන්...

**ජගත් ජේ. එදිරිසිංහ**
('රාජාලි පියාපත' කාව්‍ය සංග්‍රහය - 2010 )

රූපකාර්ථවත් කවි බසක් ආශ්‍රය කරගෙන ගොඩනැගෙන මෙම කවියේ මුඛ්‍ය රූපකය රාජාලියෙකි. සමාජයේ ජීවත් වන මුළු මහත් මිනිස් සමූහයක් දෙස ඉහළින් බලා සිටින අදිසි රුවක් රාජාලියාගෙන් සංකේත ගතවී ඇතැයි සිතේ. නමුදු ඒ බැල්ම සමාජය දෙස හෙලන දයාර්ද්‍ර බැල්මක් නම් නොවේ. සමාජයේම තැලී පෑගී පොඩිවන, පහසුවෙන්ම ගොදුරු කරගත හැකි දුර්වලයන් තම ග්‍රහණයට නතු කරගැනීමේ අපේක්ෂාවෙන් ඔවුන් දෙස හෙලන ස්වාර්ථකාමී බැල්මකි ඒ.

කවියේ පළමු කොටසින් කියැවෙන පරිදි මුළු මහත් ලෝකයක් දකිනු රිසියෙන් රාජාලියාගේ තියුණු ඇස් ඒ වෙත යොමුවී ඇත. කවියා විසින් සූක්ෂමව චිත්‍රණය කරන මේ රාජාලියා නම් සංකේතය කවර තරාතිරමක් නියෝජනය කරන්නේ දැයි ඉතා සියුම්ව පද ටික ලිහා ගැනීමෙන් අනතුරුව වැටහේ. අප ජීවත් වන සමාජයේ වක් හෝ නොවක් අයුරින් අපව ගොදුරු කරගන්න මාන බලන බලය හෝ ධනය, එහෙමත් නැත්නම් වෙනත් දේශපාලනික අදිසි බලවේගයක් ඉන් නිරූපණය වනවා විය හැක. නමුත් ඒ අදෘශ්‍යමාන බලවේගයන් හි ඇස් ඉතා තියුණුය. ඔවුන්ගේ දර්ශන පථයට යමෙකුන් හසුවුව හොත් ඉන් සදාතනික ගැලවීමක් නම් නොමැතේමය. අපි එවැනි ප්‍රවාහයන්ට හසු නොවී මේ සමාජමය ප්‍රවාහයේම රැඳෙමින් නොරැඳෙමින් ජීවත් වන්න උත්සාහ ගනිමු. නමුත් ඒ කෙතරම් කාලයකට දැයි අප දන්නේ නැත. එවන් වූ රාජාලියකු යට උගට පිටුපසින් සිටින කුරා කුහුඹු මිනිසකු ලෙස තමාව හුවා දක්වමින් උත්තම පුරුෂයෙන් මේ කතාව අපට කියන කතකයා තවමත් නිරුපද්‍රිතව සිටී. එය එක්තරා අන්දමක වාසනාවකි. සිය දහසක් දෙනා ගොදුරු කරගැනුමට, සිය සූක්ෂම දෑස් දුරට හෙලන මේ රාජාලියාට උගට පිටුපසින්, උග පය පාමුලම සිටින මේ මනුශ්‍යය ආත්මය තවම ග්‍රහණය නොවීමම පුදුමයකි. නමුත් එය තාවකලික විය හැක.



රාජාලියාගේ පය පාමුල සිටින මේ මිනිසාට උගේ තියුණු නිය දිස්වේ. රාජාලියාගේ භයංකර තියුණු නිය වනාහී මුළු මහත් සමාජයක් ගිලගන්න බලා සිටින විසල් බලවේගයක මර්දනකාරී හිංසනකාරී වත් පිළිවෙත් විය නොහැකිද? ඒ නිය පහුරු මැද උගට ගොදුරු වූ සතුන්ගේ අමු මස් කැබලි දිස්වේ. ඒ රුහිරුද සමගිනි. ඉන් නිරන්තරයෙන් වා තලයට මිදෙන පිළී ගඳෙහි අඩුවක්ද නැත. එය ඉසිලිය නොහැක. රාජාලියාගේ බල පරාක්‍රමය හමුවේ ගොදුරුවූ අහිංසක සතෙකු යනු අප අතරේම ජීවත් වන අප වැනිම වූ තවත් එක නිර්ධන මිනිසකු නොවේද? එකිනෙකා බැගින් දස දහස් ගණන් ගොදුරු කරගන්නා මේ කුරිරු සමාජය හමුවේ මෙවැනි දර්ශන මගහැර අපේම වූ සුඛිත මුදිත ගමනාන්තයක් කරා යාම ඉතා අසීරුය. නමුත් එවන් අපෙක්ෂාවන් ගෙන් පිරිගිය ගමනාන්තයක් වෙනුවෙන්, අද දවසේ අප වෙනුවෙන් ගොදුරු වූයේ ඒ අහිංසක මිනිසා විය හැක. නමුත් මේ කතාව අපට කියන කතකයා පවා ඊටත් වඩා අසරණව ඒ දෙස බලා හිඳිනවා විනා විසල් රාජාලිය එළවා දමා මුළු මහත් සමාජයක් ගලවාගන්න තරම් ශක්තිමත් වූවකු නොවන බවක් කවිය තුළින්ම විද්‍යමාන වේ. එහි වක්‍රෝත්තිය නම්, මේ රාජාලියා පන්නා දමන්නට සරල තනි මිනිසකුට නොහැකි බවත්, මුළු මහත් සමාජයක් ලෙස එකතු වුවොත් පමණක් ඒ වෙනුවෙන් කුඩා හෝ බලාපොරොත්තුවක් තබා ගත හැකි බවත් නොවේද?

කවියේ තුන්වන කොටසින් කතකයා අපට කවියේ ප්‍රධාන කතා පුවතින් මඳක් බැහැරවී බාහිර පරිසරය දෙසට අපව කැඳවාගෙන යයි. ඒ අවස්ථාවේ අපට පෙනෙන්නේ මොනවාද? කර්ණ කටුක කාන්තාර වැලි බිමෙහි කටු අකුල් මත යන්තමට පිපී ගත් පුංචිම මලත් ගිනියම් කොට අළුකර දමන චන්ඩ සූර්ය තාපයයි.

මේ කතකයා අපට නොකියා කියන්නේ කුමක්ද? රාජාලියා ඇසුරේ පෙනුණ කුරිරු අනුකම්පා විරහිත පරපීඩනයම, ඊට හාත්පසින් නුදුරින් වෙනත් මුහුණුවරකින් දිස්වෙන බව නොවේද? ඉතින් මේ සමාජයේ, කොතන ආරාක්ෂාකාරී යැයි අපට සහතික නිකුත් කළ හැකිද?

මින් ගම්‍ය වන්නේ බැලූ බැලූ සියලුම තන්හි එකිනෙකා පාගා එකිනෙකා පරයා නැගෙන්නට තතනන බලකාමීන් මිස දුප්පත් දුර්වල මානුශිකත්වයට පොඩි හෝ ඉඩක් තියෙද යන්නයි. එය ඉතාම වේදනාකරී අත්දැකීමකි. මෙහිදී කවියාගේ කවි බස ප්‍රබල රූපකාර්ථ ඇසුරේ අපට දනවන මේ කුරිරු සමාජ යතාර්ථයට පිටු පෑ නොහැක. කවියක් වශයෙනුත් මේ ලියැවීම ඉතා ඉහළින් සිටින්නේත් මගේ සිත් ගන්නේත් එබැවිනි. ඔහු විස්තර කිරීම් වලට නොයයි. කිසිවක් කෙළින්ම නොකියයි. මේ සමාජය කියවාගන්නටත්, එය තේරුම් ගන්නටත් අවශ්‍ය පුංචි දොරටු කිහිපයක් ඔහු අපට හැර දේ. නමුත් ඒ දොරටු තුළින් අපි දකින සත්‍යය විසල්ය. ඒ අනුව මේ කවිය කවියාගේ බුහුටි කාව්‍යමය උපක්‍රමයන් හා ඔහු සතු ශක්‍යතාව පෙන්වා දේ.

කවියේ අවසාන කොටසට එන විට, කවියා නැවතත් අපව රාජාලියා කරා රැගෙන යයි. ඔහු එක එල්ලේ පවසන්නේ රාජාලියාගේ පියාපත් සෙවණ සුවදායක බවයි. මේ කියන්නේ කපන්න බැරි අත ඉඹීමක් ගැනද? නැත්නම්, කනස්සලු ස්වරයෙන් ඉබේටම කියැවෙන ඔහුගේම අන්ත අසරණ ආත්මය ගැනද? හෙට දිනය පිළිබඳ ඔහුට ඇති අවිනිශ්චිතතාව හෝ ගොදුරු ලොබ බැඳි රාජාලීන් හමුවේ ඇති එකම ගැලවීම නම් උන් මත්තේම උන් අසුරේම මියෙමින් ජීවත් වීමක් ගැනද? එසේත් නොමැති නම් දේශපාලකයන්ගේ අතකොළු බවට පත්වෙමින් අවසානයේ උන්ට වන්දිභට්ටකම් පවා කරමින් උන් මත්තේම සුපෝෂණය වී බඩ වඩා ගන්න අහිංසක අසරණ දුර්වලයන් පිරිසක් ගැනවත්ද? ඒ කෙසේ වුව කතකයා භයියෙන් හුස්මක් වත් නොගෙන රාජාලි දැහැන නොබිඳ උගේ පියාපත් අස්සේම දෑස් පියා ගන්නේ පියාපත් සෙවණේ සිසිලසට කැමති හින්දා නම් නොවේ. 'සෙවණ සිසිලයි' කියන උත්ප්‍රාසයෙන් කියැවෙන කතාවේ යටි අරුත ජීවිත පිළිබඳ ඇති දැඩි අවිනිශ්චිතතාවයයි; සැකයයි. හේ තද හුස්මක් පවා පිට නොකර ඇස් පියාගන්නේ බාහිර ලෝකයක ඇස් පනා පිට සිදුවන කුරිරු මර්දනයන් නිරුවත් ඇසින් බලගන්නට ඇති අප්‍රසන්න බව නිසාමය. හෙට දිනයේ මේ පද්ධතියේම තමනුත් කොටසක් වීමට නියමිතය යන සවිඥානක බව ඔස්සේම එතකන් මේ තාවකාලික සෙවණ යට ගොළුව හිඳීම තවත් එක දවසක් හෝ නොමැරී ජීවත් වන්නට ඔහුට අවස්ථාව සලසනු ඇත. නමුත් එහෙම ජීවත්වීමම මැරුණා හා සමාන නොවන්නේද?

බැලූ බැල්මට පෙනෙන සරල රූපක කිහිපයක් ඔස්සේ අපේ විඥානයට ඇතුළුවී අප සියලු දෙනාම පැටලී සිටින මර උගුලක් වන් මේ සමාජ යතාර්ථය ගැන ඥානනයක් ඇති කරන්නට මේ කවිය සමත් වේ. අදෘශ්‍යමාන දේශපාලනික අර්ථක්‍රමය ඔස්සේ මුදල හා බලය මගින් මුළු මහත් සමාජයකම යායුතු දිශාව තීරණය කරන, නූල් හසුරවන්නන් ගැන නොකියා කියන මේ කවිය, එයින් නතර නොවී ඒ තුළම පීඩාවට පත්වන්නන් ගැනත්, ඒ කුරිරු ක්‍රමය ඇසුරේම ජීවත් වන තවත් ආකරයක අසරණයන් ගැනත් එකවිට නියෝජනය කරයි; කුඩා කවි සිරුරක් දරාගෙන පුළුල් අර්ථ නිරූපණයකට ඉඩ තනා විසල් සමාජ වපසරියක් ආවරණය කරයි. ඉතින් අපි තව දුරටත් රාජාලි පියාපත් සෙවණ යට තාවකාලික සුවයක් හමුවේ අවිනිෂ්චිත හෙටක් වෙනුවෙන් අත පය හකුලාගෙන සීතලට ගුලිවෙමුද? පිළිතුර ඔබ සතුය.

